**වත්තල මාබෝල නගර සභාව - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

වත්තල මාබෝල නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වත්තල මාබෝල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1)(ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දැනට අධිකරණය භාරයේ පවතින ලැප්ටොප් පරිගණකය සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන තුළ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ සටහන් මඟින් හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කිරීම කළ යුතුවේ. |

### 1.6.2 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට **අනුකූල නොවීම**

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 18.7 හා LGD/10A/4/න.ගි/2019 අංක දරන පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති ලිපිය ප්‍රකාරව භෞතික පරීක්ෂාවේදී හඳුනාගෙන තිබූ සභාව සතු ඉඩම් 15 ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබූ ඉඩම් 02 ක භූමි ප්‍රමාණය ස්ථාවර වත්කම් ලේඛනයෙහි සඳහන්ව තිබූ ප්‍රමාණයට වඩා පර්චස් 63.33 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. එම අඩු වූ භූමියේ ප්‍රත්‍යාගණිත වටිනාකම රු.88,592,000 ක් විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට හා පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |

## 1.6.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජර්නල් සටහන් මගින් ගිණුම්ගත කර තිබුණු රු.5,052,550 ක පුනරාවර්තන වියදම් තුළ රු.3,798,073 ක ප්‍රාග්ධන වියදම් ඇතුළත් කර තිබීමෙන් වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා වත්කම් හෝ කෙරීගෙන යන වැඩ එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම මගින් නිවැරදි කරන බව දන්වමි. | |
| (ආ) | ඉකුත් වර්ෂයේ ණයහිමියන් ලෙස වෙන්කර තිබුණ රු.108,500 ක නීතිඥ ගාස්තු සමාලෝචිත වර්ෂයේදී කපා හැර තිබුණ අතර 2019 හා 2020 වර්ෂ වෙනුවෙන් 2021 අප්‍රේල් 23 දින ගෙවන ලද රු.108,500 ක් ණයහිමි ප්‍රතිපාදනය කපා හැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමක් අවශ්‍ය නොවන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | 2021 වර්ෂයේ කසළ අපහරණ ගාස්තු බිල් කිරීම රු.4,581,000 ක් වූ අතර වර්ෂයේ ලැබීම් රු.2,142,850 ක් වූයෙන් රු.2,438,150 ක් වැඩිපුර බිල් කිරීමෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ව්‍යාපාරික ස්ථාන ඉවත් කර පරිගණක පද්ධතිය යාවත් කාලීන කිරීමට කමිටුවක් පත්කොට ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වමි. | |

## 1.6.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 06 ක 2021 දෙසැම්බර් 31 දිනට ගිණුමේ ශේෂය හා උපයෝගී ලේඛන අනුව ශේෂය අතර රු.98,891,470 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කරමි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

**1.6.5** ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජංගම වත්කම් යටතේ වසර 12 පමණ කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙන එන අගරු චෙක්පත් 08 ක රු.241,564 ක් වූ ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අය කර නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු. 48,496,019 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.102,519,308 ක් විය.

**2.2.1** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 ජනවාරි 01 දිනට වූ රු.47,176,842 ක හිඟ වරිපනම් ශේෂයෙන් 2021 දෙසැම්බර් 31 දිනට අය කර තිබූ මුදල රු.9,205,267 වූයෙන් අයකිරීම්වල ප්‍රතිශතය සියයට 20 ක් විය. | හිඟ අය කර ගැනීමට අදාළ කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) 2021 ජනවාරි 01 දිනට වූ රු.302,200 ක හිඟ කර්මාන්ත හා ව්‍යාපාර බදු ශේෂයෙන් 2021 දෙසැම්බර් 31 දිනට අය කර තිබූ මුදල රු.41,750 ක් වූයෙන් අය කිරීම් ප්‍රතිශතය සියයට 1 ක් පමණක් විය. | 2021 වසරේ පැවති වසංගත තත්ත්වය මත ආදායම් ප්‍රවර්ධනය වැඩසටහන් සීමාකිරිමට සිදුවූ බව දන්වමි. | |

**2.2.2 කුලී**

**---**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------- | ------------ |
| (අ) | හැදල වෙළඳ සංකීර්ණයේ ගිවිසුම්ගත කාලය ඉකුත් වූ කඩ කාමර 15 ක් නිරීක්ෂණය වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලිය රු.813,968 ක් හා ගිවිසුම්ගතවීම් සිදු කර නොමැති වීම හා 2020 දෙසැම්බර් 31 දිනට ගිවිසුම් අවසන්වී නැවත ගිවිසුම් අළුත් නොකිරීම නිසා කාලාවරෝධය මත නඩුපැවරිය නොහැකිවීම හේතුවෙන් හැදල වෙළඳ සංකීර්ණයේ මස්කඩ ලබා ගෙන තිබූ බදුකරුවන් 07 දෙනෙකුගෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයවියයුතු රු.1,639,053 ක් හිඟ කුලී මුදල් නීත්‍යානුකූලව අයකර ගැනිමට නොහැකි වී තිබුණි. | වලංගු ගිවිසුමක් නොමැති වීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් කටයුතු කළ නිලධාරින් හඳුනාගැනීම ගැටළු සහගතව ඇති බව හා පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් සඳහා යොමුකොට එය ප්‍රධාන ලේකම් ගේ නීති නිලධාරි වෙත යොමුකර ඇති බව දන්වමි. | නීත්‍යානුකූල වලංගු ගිවිසුමකට එළඹිය යුතුවේ. |
| (ආ) | සභාවට අයත් ගොඩනැගිල්ලක් ටෙන්ඩර්කර බදුදීම සඳහා පලකල පුවත් පත් දැන්වීම නිවැරදි නොවීම හේතුවෙන් රු.50,544 ක් වැය කර නැවත දැන්වීමක් පල කිරීමට වැයවූ මුදල එයට වගකිව යුතු නිලධාරින්ගෙන් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් පරීක්ෂකගේ ප්‍රමාද දෝෂයක් මත ටෙන්ඩර් මුදල පෙර මුදල ලෙසත් ඒ හේතුවෙන් කාලය වසර 10 ක් ලෙසත් ඔහුගේ වාර්තාවේ සටහන්ව ඇති බවත් හඳුනාගෙන මෙම දැන්වීම නිවැරදි කරන ලද බව දන්වමි. | වැයවූ අතිරේඛ වියදම එයට වගකිව යුතු පුද්ගලයාගෙන් අය කර ගත යුතුවේ. |
| (ඇ) | හැදල වෙළඳ සංකීර්ණයේ අංක HM/41D හා HM/41C දරන කඩ කාමර 2 එක් පුද්ගලයෙකුට ඔහුගේ ඉල්ලීමට අනුව 2008 අගෝස්තු 08 දින ටෙන්ඩර් කිරීමකින් හා ගිවිසුම්ගත වීමක් තොරව බදු දී තිබුණි. 2022 පෙබරවාරි 28 දින තෙක් ගිවිසුම්ගතවී නොතිබූ අතර ආදායම් පරික්ෂක විසින් මෙම කඩ කාමර භාවිතයට ගත නොහැකි බව පවසා 2019 දෙසැම්බර් සිට බිල් කිරීම නවතා තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට හිඟ මුදල පිළිවෙලින් රු.234,878 ක් හා රු.465,112 ක් වී තිබූ අතර 2020 ජුනි 18 දිනැති ගම්පහ දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක LGD/GM/1/7/පොදු/U-07/2020 දරන | ගිවිසුම් අවසන් වූ පසු ගිවිසුම් ගත කිරීමට ඉදිරි කටයුතු නොකල නිලධාරීන් හඳුනාගෙන වාර්තා කරන ලෙස දන්වා ඇති බව සඳහන් කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

ලිපිය අනුව ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසු ගිවිසුම්ගත වීමක් සිදුව නොමැති නිසා හිඟ මුදල් අය කිරීමට නීත්‍යානුකූල හැකියාවක් නොමැති හෙයින් ඒ සඳහා ඉදිරි කටයුතු නොකළ නිලධාරින් හඳුනාගෙන ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණද එසේ හඳුනාගෙන නොතිබුණි.

**2.2.3 වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙළඳ සැල්වල කසළ අපහරණය වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට අය විය යුතුයැයි දක්වා තිබූ කසළ අපහරණ ගාස්තු හිඟ ශේෂය රු.11,810,498 ක් වූ අතර, කසළ ගාස්තු, සේවා සැපයීමේ ගාස්තුවක් බැවින් කසළ අපහරණය අත් හිටුවීමට පියවර නොගෙන මෙවැනි හිඟ ශේෂ පැවතිම පිළිබඳව සොයාබලා අවශ්‍ය පියවර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | මුදල් නොගෙවන ආයතන වලින් කසළ ලබාගැනීම අත්හිටුවා ඇති නමුත් මෙම ගාස්තු නොගෙවන ආයතන පරිගණක පද්ධතියෙන් ඉවත් නොවීම හේතුවෙන් මාසිකව බිල් කිරීම මත හිඟ ශේෂ පෙන්වයි. පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වමි. | හිඟ අය කර ගැනීමට සහ ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තියයටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබවිහරණය පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (ආ) 2021 ජනවාරි 07 දින සිදුවූ අනතුර සම්බන්ධව රක්ෂණ සමාගම විසින් ගෙවීමට එකගවී ඇති මුදල රු.44,200 ක් වූ අතර ගරාජය වෙත ගෙවිය යුතු රු.68,550 ක මුදලේ වෙනස වන රු.24,350 ක මුදලින් පරීක්ෂණ කමිටුව විසින් සියයට 75 ක් රියදුරුගෙන් හා සියයට 25 ක් තාක්ෂණ නිලධාරිගෙන්ද අය කිරීමට නිර්දේශ කර තිබුණි. නමුත් සභාව විසින් එම නිර්දේශය අත්හිටුවා සභා අරමුදලින් ගෙවීමට 2022 මාර්තු 18 දින පැවති සභාවේදී තීරණය කර තිබුණි. | ඉතිරි මුදල සභා අරමුදලින් ලබාදීමට 2022 මාර්තු 18 දින මාසික සභා රැස්වීමේ 5.1.8 යටතේ අනුමත වී ඇති අතර 2022 අප්‍රේල් 19 දිනැතිව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා සඳහා උපදෙස් ලබාදෙන ලෙස පළාත් පාලන කොමසාරිස් (බ.ප.) වෙත දන්වා යවා ඇති බව දන්වමි. | පළාත් පාලන කොමසාරිස්වරයාගේ උපදෙස් අනුව ක්‍රියා කළයුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2013 අගෝස්තු 22 දින රු.9,475,000 කට සභාව විසින් මිලදී ගෙන තිබූ අක්කර 01 පර්චස් 29.50 ක ඉඩම මිලදී ගැනීමේදී එහි නිරවුල් අයිතිය ලබා ගෙන මිලදී ගැනිම සිදු කර ගත යුතු වුවද එහි අනවසර පදිංචි නිවාස 03 ක් සමග මිලදී ගෙන තිබූ අතර ඉඩම වටා තාප්පයක්ද ඉදිකර තිබුණි. එම නිවාස 03 සඳහා විදුලි බලය ලබා ගෙන තිබූ බැවින් එම විදුලිය ලබා ගැනීම සභාවේ අවසරයකින් සිදුව තිබූ අතර අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු නොකොට 2021 පෙබරවාරි 23 දින සභා තීරණය පරිදි නගර සභාවට කුලී මුදලක් අය කර ගත හැකි ක්‍රමයකට එම නිවාස පදිංචිකරුවන්ටම ලබා දීමටද තීරණය කර තිබුණි. වාහන අංගනයක් ඉදි කිරීම සඳහා 2021 වර්ෂයේදී 2022 වර්ෂයේ අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කර තිබුණද මෙම නිවාස 03 පිහිටීම නිසා එම ගැටළුව නිරාකරණය කර නොගෙන වාර්ෂික අයවැයට ඇතුළත් කර තිබූ හෙයින් මෙම ඉදි කිරීම සිදු කිරීමට නොහැකිවී තිබුණි. | පරීක්ෂා කර බලා ගත යුතු ක්‍රියා මාර්ග සභාව වෙත දන්වන ලෙස පළාත් පාලන කොමසාරිස් (බ.ප.) විසින් පළාත් පාලන සහකාර කොමසාරිස් (ගම්පහ) වෙත උපදෙස් ලබාදී ඇති බව දන්වමි. | වත්කම් ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කර සභාවේ නිරවුල් අයිතිය තහවුරු කල යුතුවේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**සේවක ණය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරින් 05 දෙනෙකුගෙන් රු.766,987ක් ද, සේවය අතහැර ගිය නිලධාරින් 96 දෙනෙකුගෙන් රු.251,466 ක් ද හා බැහැරට ස්ථාන මාරුවී ගිය නිලධාරින් 04 දෙනෙකුගෙන් රු.383,788 ක් ද වශයෙන් එකතුව රු.1,402,241 ක් අය නොවී පැවතෙන අතර එම ශේෂයන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ |